# කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

# වී අලෙවි මණ්ඩලයේ තනතුරු පුරප්පාඩු

වී අලෙවි මණ්ඩලයේ පද්ධති පරිපාලක තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරාලන ලද අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## පද්ධති පරිපාලක - (JM 1-1) - තනතුරු 01

**(අ) බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම (පහත සුදුසුකම් 1 හෝ 2 හෝ 3 හෝ 4 හෝ 5)**

**සුදුසුකම්**

01. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය / පද්ධති පරිපාලනය පිළිබඳ උපාධිය සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ ව්‍යවස්ථාපිත / වාණිජ ආයතනයක එක් අවුරුදු පළපුරුද්දක් ලබා තිබීම.

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට (පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණ / පද්ධති පරිපාලනය) ගැලපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීමෙන් පසු අදාළ විෂය ක්ෂේත්‍රයේ එක් අවුරුද්දක පළපුරුද්දක් ලබා තිබීම.

03. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක්, පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය / පද්ධති පරිපාලනය සම්බන්ධයෙන් ලබා ගැනීමෙන් පසු එක් අවුරුදු පළපුරුද්දක් ලබා තිබීම.

04. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක්, පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය / පද්ධති පරිපාලනය සම්බන්ධයෙන් ලබා තිබීම.

    සහ

    සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත වාණිජ ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

05. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) පස්වැනි (05) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක්, පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය / පද්ධති පරිපාලනය පිළිබඳව ලබා තිබීම.

    සහ

    සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

**(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම (පහත 1 හෝ 2 හෝ 3)**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

02. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 1) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ තොරතුරු තාක්ෂණික ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

03. තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සම්බන්ධයෙන් වන විට,

    කළමනාකරණ සහකාර - තාක්ෂණ (MA 2) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ තොරතුරු තාක්ෂණික ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**(ඇ) වැටුප් ක්‍රමය**

JM 1-1 - 2025 - රු. (72,650 - 10 X 1,360 - 18 X 2,040 - 122,970)

(2025.03.25 දිනැති 1/2025 අංක දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව 2026 වර්ෂයට අදාළ වැටුප් පියවරෙහි පිහිටුවනු ලැබේ.)

**(ඈ) වයස් සීමාව**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**(ඉ) වෙනත් සුදුසුකම්**

සෑම අයදුම්කරුවෙකුම,

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුයි.
- විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුයි.

**පොදු කරුණු**

- මෙම තනතුරු ස්ථිර තනතුරු වේ. සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.
- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට තනතුරට ඉල්ලුම් කිරීම පිණිස අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතුය.
- දැනට රාජ්‍ය ආයතනවල සේවයේ නියුක්ත අයදුම්කරුවන් ආයතනයේ ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- ජීව දත්ත තොරතුරු ඇතුළත් තමා විසින් සකස් කරන ලද අයදුම්පතක් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් තහවුරු කරන ලද ලේඛන වල සහතික කරන ලද පිටපත් සහිතව ඥාතීන් නොවන දෙදෙනෙකුගේ තොරතුරු ද ඇතුළත්ව 2026.10.09 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට යොමු කිරීමට කටයුතු කළ යුතුය.
- අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුරු නාමය සඳහන් කළ යුතුය.
- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක හා / හෝ ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදු කෙරේ.
- පත්වීම් සම්බන්ධයෙන් බලපෑම් කිරීම / සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම නුසුදුස්සෙකු වීමට හේතුවේ.
- පත්වීම් සම්බන්ධයෙන් අවසාන තීරණය වී අලෙවි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

**සභාපති,**
**වී අලෙවි මණ්ඩලය,**
**නිවාස මහ ලේකම් ගොඩනැගිල්ල, 6 වන මහල,**
**සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.**